සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

33 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

## ගිණුම්කරණය I

කාලය පැය දෙකයි

උපදෙස්

- අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු හතර බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

01. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පොදු පරමාර්ථ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ වන්නේ,
1. ගිණුම්කරණ ඒකකයක ආයෝජකයන්ට, රජයට, මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම.
2. ව්‍යාපාරයක ගනුදෙනු මූල්‍ය පදනම මත පොත්වල වාර්තා කිරීමයි.
3. ව්‍යාපාරයක අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා අතීත හා අනාගත තොරතුරු සැපයීමයි.
4. ව්‍යාපාරයක දැනට සිටින සහ අපේක්ෂිත (විභව ආයෝජකයන්ට) ණය සපයන්නනට සහ අනිකුත් ණය හිමියන්ට ව්‍යාපාරයට සම්පත් සැපයීම පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීම.
5. ආයතනයක වාර්ෂික විගණනයට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීම. (.......)

02. පහත කාර්යයන් ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ සිදුවන අනුපිළිවෙල කුමක්ද?

A - මූලික පොත්වල සටහන් කිරීම.
B - ව්‍යාපාර ගනුදෙනු සිදුවීම.
C - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම .
D - මුලාශ්‍ර ලේඛන පිළියෙල කිරීම.
E - ගනුදෙනු ලෙජරයට පිටපත් කර, තුලනය කිරීම.

1. B,D,A,E,C 2. A,B,C,D,E 3. B,D,E,A,C
4. A,B,D,E,C 5. D,B,A,E,C (.......)

03. ව්‍යාපාරයක ණය හිමියන්ට ගෙවිය යුතු රු. 120,000 ක ශේෂයක් එහි අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් පියවන ලදී. පියවන අවස්ථාවේදී 10% වට්ටමක් දෙන ලදී. මෙම ගනුදෙනුව වගකීම් හා හිමිකමට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ,

| | වගකීම් | හිමිකම් |
|---|---|---|
| 1. | රු. 108,000 න් අඩුවේ | රු. 108,000 න් අඩුවේ |
| 2. | රු. 120,000 න් අඩුවේ | රු. 120,000 න් වැඩිවේ |
| 3. | රු. 108,000 න් අඩුවේ | රු. 108,000 න් වැඩිවේ |
| 4. | රු. 120,000 න් අඩුවේ | රු. 120,000 න් අඩුවේ |
| 5. | රු. 132,000 න් අඩුවේ | රු. 132,000 න් වැඩිවේ |

(.......)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවලට පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ,

1. උපචිත 2. ඒකක 3 අඛණ්ඩ පැවැත්ම 4. මූල්‍ය ගිණුම් 5. කාලච්ඡේද (.......)

05. තොරතුරු භාවිතා කරන පාර්ශව වල තීරණ වෙනස් කිරීමට මූල්‍ය ප්‍රකාශන තොරතුරුවලට හැකියාවක් ඇත්නම් එම මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු පහත කුමන ගුණාංගයෙන් යුක්තවේ ද?

1. කාලීන බව 2. සංසන්දනාතමක බව 3. විශ්වසනීය නියෝජනය
4. සත්‍යාපනය කළහැකි බව 5. අදාල බව (.......)

06. ව්‍යාපාරයක ගිණුම් කාල පරිච්ඡේදයක් තුළ මුළු වත්කම් රු. 500,000 න්ද මුළු වගකීම් 200,000 න්ද වැඩිවිය. අයිතිකරු වර්ෂය තුළ සිදුකළ ගැනිලි රු. 50,000 කි. ව්‍යාපාරය උපයන ලද ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණ ද?

1. රු. 350,000 ක ලාභයකි 2. රු. 350,000 ක අලාභයකි 3. රු. 750,000 ක ලාභයකි
4. රු. 700,000 ක අලාභයකි 5. රු. 200,000 ක අලාභයකි (.......)

07. හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම, ආපසු එවුම්, සමුච්ත ක්‍ෂය හා ගැනිලි යන එක් එක් ගිණුම් පිළිවෙලින් වර්ග කළ හැක්කේ,

1. වගකීම්, ආදායම්, වගකීම්, වියදම් 2. වත්කම්, ආදායම්, වගකීම්, හිමිකම්
3. වත්කම්, ආදායම්, වත්කම්, හිමිකම් 4. වගකීම්, වියදම්, වත්කම්, වියදම්
5. වත්කම්, වියදම්, වගකීම්, හිමිකම් (.......)

08. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව වගකීමක ලක්‍ෂණ ලෙස පහත නිර්ණායක දී ඇත.

A - නිර්වචනයට අනුකූල වීම
B - ගෙවා නිදහස් වීමේදී ව්‍යාපාරය සතු ආර්ථික සම්පත් පවරාදීමේ වර්තමාන බැදීමක් පැවතීම
C - අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහිවී තිබීම
D - අගය විශ්වසනීය ලෙස මැනිය හැකිවීම

ඉහත ඒවා අතුරින් වගකීමක ලක්‍ෂණ ලෙස සැලකිය හැක්කේ,

1. A පමණි 2. A,B පමණි 3. A,B,C පමණි 4. B,C පමණි 5. A,B,C,D යන සියල්ලම (.......)

09. පහත ගනුදෙනු අතරින් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,

1. වෙළඳ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.
2. විනාශ වූ තොගයක් වෙනුවෙන් රක්‍ෂණ වන්දියක් ලැබීම
3. අයිතිකරු පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ වියදමක් පියවීම
4. භාණ්ඩ මිලට ගැනීමේ දී වෙළඳ වට්ටමක් ලැබීම
5. ණය හිමියන්ට මුදල් ගෙවීමේ දී මුදල් වට්ටමක් ලැබීම (.......)

10. පහත දැක්වෙන කුමන ගනුදෙනුව ආයතනයක ගැනුම් ජ'නලයෙහි සටහන් කරනු ලබයි ද?

1. ව්‍යාපාරයේ සියලුම ණයට ගැනුම් 2. නැවත විකිණීමේ අරමුණින් ණයට ගත් භාණ්ඩ
3. දේපළ පිරියත උපකරණ ණයට ගැනුම් 4. වෙළඳ භාණ්ඩ අත්පිට ගැනුම්
5. ලී බඩු උපකරණ ණයට ගැනුම් (.......)

11. තාරක පොදු සමාගම 15% VAT සඳහා ලියාපදිංචි සමාගමකි..2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පහත ගනුදෙනු සිදුවී ඇත

1. VAT සහිත විකුණුම් රු.460,000
2. VAT සහිත ගැනුම් රු.115,000
3. වර්ෂය තුළ ගෙවූ VAT රු.20,000

2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු VAT වගකීම කොපමණ ද?

1. රු. 25,000 2. රු. 45,000 3. රු. 60,000 4. රු. 115,000 5. රු. 450,000 (.......)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **ප්‍රශ්න අංක 12,13, සහ 14 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**

  ව්‍යාපාරයක 2020 මාර්තු මාසයේ පහත තොරතුරු ඔබට සැපයේ,
  - මුදල් ලැබීම් ජ'නලයේ එකතුව රු. 460,000
  - මුදල් ගෙවීම් ජ'නලයේ එකතුව රු. 210,000
  - මාර්තු 31 දිනට ලද බැංකු ප්‍රකාශනයේ සටහන් තොරතුරු
    1. උපලබ්ධි වූ චෙක්පත් රු. 390,000
    2. ස්ථාවර නියෝග ගෙවීම් රු. 22,000
    3. ණයගැති සෘජු ප්‍රේෂණ රු. 80,000
    4. ගෙවීම් කළ චෙක්පත් රු. 180,000
  - 2020.03.01 දිනට මුදල් ශේෂය රු.62,000 කි

12. 2020.03.31 දිනට මුදල් ගිණුමේ ශේෂය කොපමණ ද?

    1. රු. 62,000 2. රු. 210,000 3. රු. 312,000 4. රු. 460,000 5. රු. 670,000 (.......)

13. 2020.03.31 දිනට සංශෝධිත මුදල් ගිණුමේ ශේෂය කොපමණ ද?

    1. රු. 84,000 2. රු. 102,000 3. රු. 312,000 4. රු. 370,000 5. රු. 522,000 (.......)

14. 2020.03.31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය කොපමණ ද?

    1. රු. 242,000 2. රු. 310,000 3. රු. 330,000 4. රු. 460,000 5. රු. 670,000 (.......)

15. ව්‍යාපාරයක 2020.03.31 දිනට සකස් කළ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල ට අනුව රු.262,000 ක ලාභයක් ලැබී තිබුණි. පසුව කරන ලද විමර්ශනවලදී පහත වැරදි අනාවරණය වී ඇත.
    - ණයට විකුණුම් රු.50,000 ක් විකුණුම් ජ'නලයේ ලියා නැත
    - ආපසු යැවුම් රු.15,000 ක් ගැනුම් ගිණුමට බැර කර ඇත.
    - මුදල් ගෙවීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු.12,000 ක් දුන් වට්ටම් ගිණුමට හර කර ඇත

    2020.03.31 දිනට **නිවැරදි** ලාභය කොපමණ ද?

    1. රු. 267,000 2. රු. 291,000 3. රු. 301,000 4. රු. 312,000 5. රු. 336,000 (.......)

16. සී/ස සමාගමක තොග පිළිබඳ පහත විස්තර දැකිය හැකි විය.

| **අයිතමය** | **පිරිවැය (රු.)** | **අපේක්ෂිත විකුණුම් ආදායම (රු.)** | **අපේක්ෂිත විකුණුම් වියදම (රු.)** |
|---|---|---|---|
| 1 | 25,000 | 30,000 | 6000 |
| 2 | 12,000 | 15,000 | 2000 |
| 3 | 24,000 | 32,000 | 6000 |

අයිතම ක්‍රමය මත තොග අගය කරන්නේ නම් ගිණුම් වර්ෂය අවසාන දිනට තොගයේ පිරිවැය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොග වටිනාකම කොපමණ ද?

| | **තොගයේ පිරිවැය (රු.)** | **තොගයේ අගය (රු.)** |
|---|---|---|
| 1. | 25,000 | 24,000 |
| 2. | 37,000 | 45,000 |
| 3. | 61,000 | 60,000 |
| 4. | 61,000 | 77,000 |
| 5. | 77,000 | 77,000 |

(.......)

17. පහත තොරතුරු 2020 මාර්තු මාසය සඳහා සමාගමක තොග අයිතමයකට අදාල වේ

| **දිනය** | **විස්තරය** | **ප්‍රමාණය (ඒකක)** | **ඒකකයක පිරිවැය (රු.)** |
|---|---|---|---|
| 2020.03.01 | ශේෂය | 2000 | 50 |
| 202003.15 | ගැනුම් | 3000 | 80 |
| 2020.03.28 | විකුණුම් | 3000 | ? |

සමාගම තොග අගය කිරීම සඳහා පෙර පිවිසි-පෙරපිට (FIFO) ක්‍රමය භාවිතා කරයි



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP-EXAM

2020.03.31 දිනට විකුණුම් පිරිවැය සහ අවසන් තොගයේ අගය කොපමණ ද?

| | **විකුණුම් පිරිවැය (රු.)** | **තොගයේ අගය (රු.)** |
|---|---|---|
| 1. | 80,000 | 160,000 |
| 2. | 80,000 | 100,000 |
| 3. | 100,000 | 180,000 |
| 4. | 180,000 | 100,000 |
| 5. | 180,000 | 160,000 |

(.......)

18. පහත දී ඇති තොරතුරු නිෂ්පාදන ව්‍යාපාරයක 2020 මාර්තු මාසයට අදාල වේ. (රු.000')

| | **(රු.000 වලින්)** |
|---|---|
| පාරිභෝජනය කළ ඍජු ද්‍රව්‍ය | 400 |
| ඍජු ශ්‍රමය | 200 |
| කම්හල් පොදු කාර්ය පිරිවැය | 150 |
| අමුද්‍රව්‍ය තොග වැඩිවීම | 50 |
| නොනිමි තොග අඩුවීම | 100 |

2020 මාර්තු මාසයට අදාලව ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

| | **ප්‍රාථමික පිරිවැය (රු.)** | **මුළු නිෂ්පාදන (රු.)** |
|---|---|---|
| 1. | 600,000 | 550,000 |
| 2. | 600,000 | 650,000 |
| 3. | 550,000 | 600,000 |
| 4. | 550,000 | 800,000 |
| 5. | 650,000 | 900,000 |

(.......)

- **ප්‍රශ්න අංක 19 සහ 20 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**

  - 2017.04.01 දින ආරම්භ කළ සුභ සාධක සංගමයක සාමාජික සංඛ්‍යාව 50 ක් වූ අතර ඉන් 10 දෙනෙකු යාවජීව සාමාජිකයන් වේ.
  - වාර්ෂික සාමාජික මුදල රු.1000 වන අතර යාවජීව සාමාජික මුදල එමෙන් දහ ගුණයකි.
  - යාවජීව සාමාජිකත්වය වසර 10 ක් තුළ ආදායමේ හඳුනාගනී.
  - 2019.04.01 දිනට පහත දෑ දැකිය හැකි විය.

    | | |
    |---|---|
    | හිඟ සාමාජික මුදල | රු. 12,000 |
    | කලින් ලැබූ සාමාජික මුදල | රු. 10,000 |
    | යාවජීව සාමාජික අරමුදල | රු. ? |

  - 2020.03.31 දිනට සාමාජිකයින් 08 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

19. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම සහ වර්ෂය තුළ මුදලින් ලැබූ සාමාජික මුදල,

| | **සාමාජික මුදල් ආදායම (රු.)** | **මුදලින් ලද සාමාජික මුදල (රු.)** |
|---|---|---|
| 1. | 32,000 | 30,000 |
| 2. | 32,000 | 34,000 |
| 3. | 40,000 | 34,000 |
| 4. | 50,000 | 34,000 |
| 5. | 50,000 | 44,000 |

(.......)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

20. 2020.03.31 දිනට යාවජීව සාමාජික අරමුදල් ශේෂය කොපමණ ද?

1. රු. 70,000 2. රු. 80,000 3. රු. 90,000 4. රු. 100,000 5. රු. 120,000 (.......)

21. පහත කුමන ප්‍රකාශනය 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුකූල වන්නේ ද?

A - හවුල්කරුවන් අතර ලාභාලාභ සමසමව බෙදාගත යුතුය
B - හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත පොලී ගෙවිය යුතුය
C - හවුල්කරුවන් වැටුප් සඳහා හිමිකම් නොලබයි.
D - හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා 5% පොලී ගෙවිය යුතුය

1. A පමණි 2. A,B පමණි 3. A,B,C පමණි 4. A,C,D පමණි 5. A,B,C,D යන සියල්ලම (.......)

- **ප්‍රශ්න අංක 22,23,24 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**

අමාලි සහ බිමාලි 3:2 අනුපාතයට ලාභලාභ බෙදාගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2019.04.01 දින තමාලි බඳවාගත් අතර ඇය විසින් රු.500,000 ප්‍රාග්ධනය ලෙස රැගෙන එන ලදි. එදිනම ඇස්තමේන්තු කළ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගලපන ලදි.

අමාලි, බිමාලි සහ තමාලි හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත පරිදි වේ.

- ලාභාලාභ අනුපාතය 3:2:1 වේ.
- අමාලිට සහ බිමාලිට රු. 180 000 බැගින් වාර්ෂික වේතන ගෙවීම්.
- ප්‍රාග්ධන ශේෂ මත 10% පොලී ගෙවීම.
- ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ

| | **ප්‍රාග්ධන ගිණුම් ශේෂ (රු.000)** | | **ජංගම ගිණුම් ශේෂ (රු.000)** | |
|---|---|---|---|---|
| | **2019.04.01 දිනට** | **2020.03.31 දිනට** | **2019.04.01 දිනට** | **2020.03.31 දිනට** |
| අමාලි | 1200 | ? | 500 | 1120 |
| බිමාලි | 1000 | ? | 400 | ? |
| තමාලි | - | 300 | - | ? |

22. තමාලි බඳවාගත් දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය කොපමණ ද?

1. රු. 800,000 2. රු. 1200,000 3. රු. 1500,000
4. රු. 2000,000 5. රු. 3000,000 (.......)

23. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හවුල් ව්‍යාපාරය ඉපයූ ලාභය කොපමණ ද?

1. රු. 200,000 2. රු. 400,000 3. රු. 600,000
4. රු. 650,000 5. රු. 1246,000 (.......)

24. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ අමාලිට බෙදාහරින ලද මුළු ලාභය කොපමණ ද?

1. රු. 100,000 කි. 2. රු. 300,000 කි. 3. රු. 440,000 කි.
4. රු. 620,000 කි 5. රු. 650,000 කි (.......)

25. VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් 2019.10.01 දින අත්පත්කරගත් යන්ත්‍රයක් පිළිබඳ පහත තොරතුරු සැපයේ (VAT ප්‍රතිශතය 15% කි)

| | (රු.) |
|---|---|
| ගැනුම් මිල VAT සහිත | 690,000 |
| වැඩබිම සකස් කිරීමේ වියදම | 150,000 |
| යන්ත්‍රය සවිකිරීමේ වියදම | 100,000 |
| පර්යේෂණ ධාවන වියදම | 70,000 |
| පර්යේෂණ ධාවන නිෂ්පාදිත විකුණුම් ආදායම | 20,000 |
| ඵලදායි ජීව කාලය වසර 10 | |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

LKAS 16 (දේපල පිරියත උපකරණ) ප්‍රමිතියට අනුව යන්ත්‍රයේ ආරම්භක පිරිවැය සහ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍ර ක්ෂය ප්‍රමාණය කොපමණ ද?

| | පිරිවැය (රු.000) | ක්ෂය ප්‍රමාණය (රු.000) |
|---|---|---|
| 1. | 600 | 60 |
| 2. | 690 | 69 |
| 3. | 750 | 75 |
| 4. | 850 | 85 |
| 5. | 900 | 45 |

(.......)

26. සමාගමක් 2020.04.01 දින කල්බදු පදනමට මෝටර් රථයක් අත්පත් කරගත් අතර,එදිනම ගෙවූ මූලික ගෙවීම රු.200,000 කි. එදින ට ඇතිවූ අවම කල්බදු ගෙවීම් වල වර්තමාන අගය රු.624,000 විය.
භාවිත අයිතිය යටතේ අත්පත් කරගත් මෝටර් රථයේ පිරිවැය කොපමණ ද?
1. රු. 200,000 කි.
2. රු. 624,000 කි.
3. රු. 824,000 කි.
4. රු. 900,000 කි
5. රු. 924,000 කි
(.......)

27. සී/ස සාගර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2020.03.31 දිනට පිළියෙල කළ අතර, ඒවා අධ්‍යක්ෂවරු විසින් අත්සන් කරන ලද්දේ 2020.06.30 දිනය 2020.03.31 දිනෙන් පසුව පහත සිදුවීම් වී ඇත.
A - 2020.03.31 දිනට සිටි, රු.12,000 ක වෙළඳ ලැබිය යුතු ශේෂයක් සහිත ණයගැතියෙකු 2020.05.02 දින මියගොස් ඇත.
B - 2020.03.31 දිනට පිරිවැය රු.600,000 වූ තොගයක් 2020.07.02 දින රු.520,000 විකුණන ලදි.
C - 2020.04.01 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 150,000 ලාභාංශයක් ගෙවීමට යෝජනා කරන ලදි.
LKAS 10 (වාර්තාකරණ දිනට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව 2020.03.31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඉහත කුමන සිද්ධීන් ගලපනු ලබයි ද?

1. A පමණි 2. B පමණි 3. C පමණි 4. A,B පමණි 5. A,B,C යන සියල්ලම (.......)

28. LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව සමාගමක මූල්‍ය ප්‍රකාශන කට්ටලයට අයත් නොවන්නේ,
1. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
4. ශේෂ පිරික්සුම
5. ගිණුම්කරණ සටහන්
(.......)

- **ප්‍රශ්න අංක 29 සහ 30 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න. (රු.000)**
  - 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සිදුවූ ගනුදෙනු
    - o විකුණුම් අයභාරය 600
    - o විකුණුම් මත වෙළඳ වට්ටම් 100
    - o ප්‍රත්‍යාගණන ලාභය 150
    - o මෙහෙයුම් වියදම් 120
  - 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රත්‍යාගණනයෙන් රු.90,000 ප්‍රත්‍යාගණන අලාභයක් ඇතිවී ඇත.

29. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය කොපමණ ද?
1. රු. 570,000 කි.
2. රු. 580,000 කි.
3. රු. 750,000 කි.
4. රු. 870,000 කි
5. රු. 1,070,000 කි
(.......)

30. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු විස්තීරණ ආදායම කොපමණ ද?
1. රු. 480,000 කි.
2. රු. 630,000 කි.
3. රු. 820,000 කි.
4. රු. 870,000 කි
5. රු. 1,220,000 කි
(.......)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

| | | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| A | ආයතනයක තොරතුරු භාවිතාකරණ පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම කළමනාකරණ ගිණුම්කරණයේ කාර්යයයි. | .................................................. |
| B | ණය හිමියෙකුට මුදල් ගෙවූ විට හිමිකම අඩුවේ. | .................................................. |
| C | මූල්‍ය ගිණුම්කරණයේ දී මුදලින් මැනිය හැකි අතීත තොරතුරු භාවිතා කරනු ලැබේ. | .................................................. |
| D | සංචිත ප්‍රාග්ධනිත කිරීමක් කළ විට හිමිකමෙහි වෙනසක් සිදු නොවේ. | .................................................. |

32. ව්‍යාපාරයක සිදු වූ පහත ගනුදෙනු නිසා ගිණුම් වර්ෂය අවසානයේ එහි වත්කම්, වගකීම් හා හිමිකම් වල ශේෂය **වැඩිවේ, අඩුවේ හෝ වෙනස් නොවේ,** දැයි සඳහන් කරන්න.

| | **ගනුදෙනුව** | **වත්කම්** | **වගකීම්** | **හිමිකම්** |
|---|---|---|---|---|
| A | තොගයක් ණයට මිලදී ගැනීම | ................ | ................ | ................ |
| B | වට්ටමකට යටත්ව ණය හිමියන්ගෙන් මුදල් ලැබීම | ................ | ................ | ................ |
| C | මෝටර් රථයක් කල්බදු පදනමට මිලට ගැනීම (මූලික තැන්පතුවක් නොමැතිව) | ................ | ................ | ................ |
| D | ව්‍යාපාරයේ වියදමක් අයිතිකරු පෞද්ගලික මුදලින් ගෙවීම | ................ | ................ | ................ |

33. පහත මූලික පොත්වලට අදාල මූලාශ්‍ර ලියවිලි සඳහන් සඳහන් කරන්න.

| | **මූලික සටහන් පොත** | **මූලාශ්‍ර ලියවිල්ල** |
|---|---|---|
| A | මුදල් ගෙවීම් ජ'නලය | ................................ |
| B | විකුණුම් ජ'නලය | ................................ |
| C | ආපසු යැවුම් ජ'නලය | ................................ |
| D | පොදු ජ'නලය | ................................ |

34. ව්‍යාපාරයක් විසින් සකස්කරනු ලබන මූල්‍ය ප්‍රකාශන අරමුණ අනුව වර්ග දෙකකට බෙදේ. ඒවා සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................

35. ව්‍යාපාරයක සුළු මුදල් හා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | **දිනය** | **(රු.)** |
|---|---|---|
| සුළු මුදල් ගිණුමේ ශේෂය | 2020.10.01 | 1600 |
| ප්‍රති පූර්ණය කිරීම | 2020.10.01 | 3400 |
| සුළු මුදල් ගෙවීම් | 2020.10.31 | 4600 |

2020 නොවැම්බර් මස සිට අග්‍රිමය රු. 2000 න් වැඩි කිරීම තීරණය කර ඇත.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

අ) 2020.11.01 දිනට ප්‍රතිපූර්ණය කරන මුදල ..............................................................................

ආ) අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමේ ජ'නල් සටහන

.......................................................................................................................................................

36. වෙළඳ ව්‍යාපාරයක පහත එක් එක් අවස්ථාවට ගැලපෙන ගිණුම්කරණ සංකල්පය ලියා දක්වන්න.

| | අවස්ථාව | සංකල්පය |
|---|---|---|
| A | කල්බද්දට ගත් වත්කමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස දැක්වීම. | ................................................ |
| B | භාණ්ඩ විකුණන අවස්ථාවේදී අයභාරය ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනීම. | ................................................ |
| C | වගකීම් සහතික සම්බන්ධයෙන් මතුවිය හැකි ගෙවීම් සඳහා වෙන්කිරීමක් සිදු කිරීම. | ................................................ |
| D | තොග අගය කිරීම සඳහා වසර 5 ක් අඛණ්ඩව FIFO ක්‍රමය භාවිතා කිරීම | ................................................ |

37. 2020.03.31 දිනට පෙරේරාගේ ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට මුදල් ගිණුමේ ශේෂයට වඩා වැඩි විය. (ව්‍යාපාරයේ මුදල් ගිණුමේ හෝ බැංකු ප්‍රකාශනයේ වැරදි නොතිබුණ බව උපකල්පනය කරන්න.) මෙම වෙනසට හේතුවිය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

1. .......................................................................................................................................................

2. .......................................................................................................................................................

38. රාජුගේ ව්‍යාපාරයේ 2020.03.31 දිනට පැවති මුළු තොගය ගිනිගෙන විනාශ විය. ඒ සඳහා 80% වන්දියක් ලබාදීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත. 2020.03.31 දිනට පැවති අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| 2019.04.01 දිනට තොගය | 250,000 |
| වර්ෂයේ ගැනුම් | 800,000 |
| වර්ෂයේ විකුණුම් | 1,200,000 |

ව්‍යාපාරය භාණ්ඩවල විකුණුම් මිල ලකුණු කරනුයේ පිරිවැයට 20% ලාභාන්තිකයක් තබාගෙනය.

අ) ගින්නෙන් විනාශ වූ තොගයේ වටිනාකම කීයද? .....................................................

ආ) විනාශ වූ තොගය හේතුවෙන් 2020.03.31 දිනට ව්‍යාපාරයේ වත්කම් වලට ශුද්ධ බලපෑම කොපමණ ද?

.................................................

39. සීමිත පාරමී සමාගමේ 2020.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 350,000 විය. එදිනට ණයගැති ලෙජර ශේෂයන්ගේ එකතුව මින් වෙනස් විය. පසුව පහත වැරදි සොයාගන්නා ලදි.

- රු. 300,000 විකුණුම් මත 15% VAT බදු ණයගැති පාලන ගිණුමේ සටහන් කර නැත.
- රු. 8000 බැරපතක් පොත්වලින් මගහැරී තිබුණි.
- රු. 10,000 දුන් වට්ටමක් අදාල ණයගැති ගිණුමේ සටහන් කර නැත.

2020.03.31 දිනට ණය ගැති පාලන ගිණුමේ සංසෝධිත ශේෂය කොපමණ ද? .......................................................



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

40. ලාභ අරමුණුකර නොගත් සංවිධානයක මුදල් ගිණුම හා ආදායම් ප්‍රකාශනය අතර වෙනස්කම් සඳහන් කරන්න.

| **කරුණු** | **මුදල් ගිණුම** | **ආදායම් ප්‍රකාශනය** |
| --- | --- | --- |
| 1. පිළියෙල කිරීමේ අරමුණ | ........................................ | ........................................ |
| 2. පිළියෙල කිරීමේ පදනම | ........................................ | ........................................ |

41. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ හිමිකම වෙනස්වන අවස්ථා 2 ක් ලියා දක්වන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

42. 2019.04.01 දින රු. 900,000 මිලටගත් ඉඩමක් 2020.03.31 දින රු. 950,000 ප්‍රත්‍යාගණනය කරන ලදි. ප්‍රත්‍යාගණනය ලාභය හෝ අලාභය සටහන් කිරීමේ ජ'නල් සටහන අගය සහිතව ලියා දක්වන්න.

..................................................................................................................................................

..................................................................................................................................................

43. 2017.04.01 දින රු. 800,000 මිලට ගත් මෝටර් රථයක් වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මෙම මෝටර් රථය 2019.04.01 දින රු. 720,000 ප්‍රත්‍යාගණනය කළේ නම් 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ පහත දෑ,

අ) ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය ..................................................

ආ) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය ප්‍රමාණය ..................................................

44. සී/ස සමාගමක් 2019.04.01 දින කොටසක් රු. 50 බැගින් සමාන්‍ය කොටස් 100,000 නිකුත් කිරීමට සංස්ථා ප්‍රකාශයක් නිකුත් කළ අතර කොටස් 120,000 සඳහ අයදුම්පත්‍ර ලැබුණි. වැඩිපුර ලද අයදුම් පත්‍ර හා මුදල් ආපසු යවා කොටස් විභාජනය කරන ලදි. ඉහත කොටස් නිකුතුවට අදාල පහත ජ'නල් සටහන් ලියන්න.

අ) මුදල් ලැබීම් ..................................................................................................................

..................................................................................................................

ආ) කොටස් විභාජනය කිරීම ..................................................................................................................

..................................................................................................................

45. සී/ස සමාගමක 2019.04.01 දිනට පහත දෑ දැකිය හැකි විය.

සා. කො. ප්‍රාග්ධනය රු. 8,000,000

රඳවාගත් ඉපයුම් රු. 5,000,000

2019.10.01 දින කොටසක් රු. 30 බැගින් කොටස් 10,000 ක් සංචිත ප්‍රාග්ධනිත කරන ලදි.

1). 2020.03.31 දිනට සා. කොටස් ප්‍රාග්ධනය රු. ..................................................................

2) 2020.03.31 දිනට සමාගමේ මුළු හිමිකම රු. ..................................................................



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

46. සී/ස සමාගමක පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම ලියා දක්වන්න.

| | **මූල්‍ය ප්‍රකාශය** | **පදනම** |
|---|---|---|
| A - | විස්තීරණ ආදායම් ප්‍රකාශනය | .................................................. |
| B - | හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය | .................................................. |
| C - | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | .................................................. |
| D - | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | .................................................. |

47. සී/ස සමාගමක 2020.03.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුමේ පහත ශේෂයන් දැකිය හැකි විය.

| | |
|---|---|
| වැටුප | 3,000,000 |
| ගෙවිය යුතු EPF | 300,000 |

සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා සේව්‍යා 15% හා සේවකයා 10% බැගින් දායක වන අතර සේවක දායකය නිසි පිරිදි ගිණුම් ගතකර ඇත.

අ) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හඳුනාගත යුතු EPF වියදම රු. ..............................................................

ආ) 2020.03.31 දිනට හඳුනාගත යුතු සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධ වගකීම රු.........................................

48. සී/ස සමාගමකට එරෙහිව පාරිභෝගිකයෙකු විසින් වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර ඇති අතර මේ වන විට නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර නැත.
ඉහත සිද්ධිය සම්බන්ධයෙන් (LKAS – 37) ප්‍රතිපාදනය, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට අනුව සමාගම කුමක් හඳුනාගත යුතු ද? ..................................................................................................................

49. 2020.03.31 දිනට සමාගමක ශේෂ පිරික්ෂුමේ පහත ශේෂයන් දැකිය හැකි විය. (රු.000)

| | |
|---|---|
| 2019.04.01 බදු වෙන්කිරීම් | 350 |
| බදු ගෙවීම් (2018/2019) | 500 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු වගකීම රු 800 000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

අ) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු බදු වටිනාකම

රු. ..........................................................................................................................................

ආ) 2020.03.31 දිනට බදු වගකීම රු. ..........................................................................................................

50. සී/ස සමාගමක් තම මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ගිණුම්කරණ සටහන් ඇතුළත් කරනු ලබයි. එසේ ඇතුළත් කරනු ලබන ගිණුම්කරණ සටහන් 02 ක් ලියා දක්වන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

❋ ❋ ❋



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 | S | II

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

## ගිණුම්කරණය II

කාලය පැය තුනයි විනාඩි 10 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10)

උපදෙස්

- **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

01 සීමිත සුධීර පොදු සමාගමේ 2020.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත වේ.

| විස්තරය | රු.'000 | රු. '000 |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ (පිරිවැය) | 12,000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1,250 | |
| 2019.04.01 දිනට තොගය | 220 | |
| ප්‍රචාරණය | 400 | |
| සේවක වැටුප් | 600 | |
| දුන් වට්ටම් | 50 | |
| අධ්‍යක්ෂ ගාස්තු | 250 | |
| විගණන ගාස්තු | 150 | |
| ගැනුම් | 3,900 | |
| විදුලිය | 40 | |
| ගෙවූ බැංකු ණය වාරිකය | 260 | |
| දුරකථන ගාස්තු | 60 | |
| 10% ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් ( 2020.03.31 ලබාගත්) | 100 | |
| මුදල් | 420 | |
| ගෙවූ ලාභාංශ | 300 | |
| විකුණුම් | | 11,100 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සා.කො.) | | 6,000 |
| රඳවාගත් ඉපයුම් (2019.04.01 දිනට) | | 300 |
| දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය (2019.04.01 දිනට) | | 600 |
| ලද වට්ටම් | | 100 |
| බැංකු ණය (2019.04.01 දින ලබාගත්) | | 1000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 900 |
| | **20,000** | **20,000** |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

**අනෙකුත් තොරතුරු**

i) 2020.03.31 දිනට තොගයේ පිරිවැය රු. 120,000 ක් වූ අතර, එදිනට ශුද්ධ උපලබ්ධි අගය රු. 80,000 කි.

ii) 2019.04.01 දිනට දේපළ පිරියත හා උපකරණ වල සංයුතිය පහත පරිදි වේ.

| | වාර්ෂික ක්ෂය අනුපාතය | පිරිවැය (රු. 000) | 2019.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු. 000) |
|---|---|---|---|
| ඉඩම් | - | 6000 | - |
| ගොඩනැගිලි | 5% | 3000 | 300 |
| මෝටර් රථ | 10% | 2000 | 200 |
| කාර්යාල උපකරණ | 5% | 1000 | 100 |
| | | **12000** | **600** |

iii) 2019.04.01 දින වෘත්තීය තක්සේරුකාර ආයතනයක් විසින් ඉඩම් රු. 7,000,000 කට ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කළ ද ගිණුම්ගත කිරීමක් සිදුකර නොමැත.

iv) 2018.04.01 දින රු. 1,000,000 කට මිලට ගත් මෝටර් රථයක් 2019.04.01 දින රු. 1,100,000 කට විකුණා ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

v) 2020.03.31 දිනට උපචිත විගණන ගාස්තු රු. 50,000 කි

vi) රු. 50,000 ක ණයගැතියකු බුන්වත් වීම හේතුවෙන් එය හානිකරණ අලාභ ලෙස කපා හැරීමටත්, රු. 120,000 ක් හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමටත් කළමනාකරණය තීරණය කර ඇත.

vii) බැංකු ණය සමාන වාර්ෂික වාරික 5 කින් ගෙවීමේ පදනම මත ලබාගෙන ඇත. වාර්ෂික වාරිකය රු. 260,000 ක් වන අතර එහි ඇතුලත් පොළිය රු. 60,000 කි.

viii) සමාගම 2019.04.01 දින සිට වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරනු ලබයි. මෙම වගකීම් සහතික සඳහා විකුණුම් අගය මත 2% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැයි විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

ix) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු වගකීම රු. 750,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතුය.

x) 2020.03.31 දින අධ්‍යක්ෂවරු පහත දෑ යෝජනා කරන ලදි.
අ) පොදු සංචිතයට රු. 500,000 ක් මාරු කිරීම.
ආ) රු. 250,000 ක අවසාන ලාභාංශයක් ගෙවීම.

**අවශ්‍ය වන්නේ,**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුධීර පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2). 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
3). 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40)**

02. අ) ගීතා සහ නීතා විසින් පිළිවෙලින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත වේ.

| | (රු.000) |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| දේපළ පිරියත හා උපකරණ | 2800 |
| **ජංගම වත්කම්** | |
| තොගය | 500 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 540 |
| මුදල් | 20 |
| | **3860** |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිනුම් | ගීතා | 1600 | |
| | නීතා | 1000 | 2600 |
| ජංගම ගිණුම් | ගීතා | (200) | |
| | නීතා | 500 | 300 |
| ණය ගිණුම - ගීතා | | | 600 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | | 360 |
| | | | **3860** |

i) 2019.04.01 දින නව හවුල්කරුවෙකු ලෙස සීතා හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. සංශෝධනය කරන ලද හවුල් ව්‍යාපාර ගිවිසුම පහත පරිදි වේ.

- ගීතා, නීතා හා සීතා පිළිවෙලින් ලාභාලාභ 5:3:2 අනුපාතයට බෙදාගැනීම
- ගීතාට මසකට රු. 15000 ක් හා නීතාට මසකට රු. 10000 බැගින් වේතන හිමිවේ.
- හවුල් කරුවකු ව්‍යාපාරයට ලබා දී ඇති ණය සඳහා 10% ක වාර්ෂික පොළියක් ගෙවීම.
- හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර, සියලු ගැලපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීම.

ii) සීතා ප්‍රාග්ධනය ලෙස රු. 200,000 ක් වටිනා කාර්යාල උපකරණ ද, රු. 250,000 ක් මුදල් ද ව්‍යාපාරයට යොදවන ලදි. නව හවුල්කරු බඳවා ගත් දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 250,000 කට ඇස්තමේන්තු කරන ලදි.

iii) ව්‍යාපාරය ණය පදනම මත සියලු ගැනුම් හා විකුණුම් සිදුකරනු ඇත.

iv) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් පහත පරිදි වේ.

| | (රු.000) |
|---|---|
| ණයගැති ලැබීම් | 6700 |
| ණයහිමි ගෙවීම් | 3300 |
| මෙහෙයුම් වියදම් ගෙවීම් | 1740 |

2020.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගත් තොරතුරු

| | (රු.000) |
|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 800 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 260 |
| තොගයේ පිරිවැය | 400 |
| උපචිත මෙහෙයුම් වියදම් | 80 |
| දේපළ පිරියත හා උපකරණ | 2600 |

v) වර්ෂය තුල දී ගීතාට සහ නීතාට මාස 10 ක වේතන මුදලින් ගෙවා ඇති අතර, එය මෙහෙයුම් වියදම් තුළ ඇතුලත් වේ.

vi) නව හවුල්කරු ප්‍රාග්ධනය ලෙස රැගෙන ආ කාර්යාල උපකරණ හැර වර්ෂය තුළදී ජංගම නොවන වත්කම් මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නොමැත. වාර්ෂික ක්ෂය ගිණුම්ගත කර නොමැත.

vii) ගීතාට අයිති ගොඩනැගිල්ලක ව්‍යාපාර කටයුතු සිදුකරන අතර ඒ සඳහා මසකට රු. 20,000 බැගින් කුලී ගෙවීමේ පදනම මත ලබාගෙන ඇති අතර වර්ෂය තුළදී ගෙවා ඇති මාස 8 කට කුලී මෙහෙයුම් වියදම් තුළ ඇතුලත් වේ. තවද ගීතාගේ වාර්ෂික ණය පොළිය ද උපචිත වේ.

viii) ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය වූ රු. 20,000 නීතා විසින් පෞද්ගලිකව ගෙවා ඇති අතර එය ප්‍රතිපූර්ණය කිරීමක් හෝ ගිණුම්ගත කිරීමක් සිදුකර නොමැත.

**අවශ්‍ය වන්නේ,**

1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (විසර්ජනයද ඇතුළුව)

2). 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් **(ලකුණු 20)**



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

ආ) සුලෝචනගේ ව්‍යාපාරයේ 2020.03.31 දිනට පිළියෙල කළ ශේෂ පරික්ෂුම අසමාන වුවද, ආධුනික ගිණුම් සහායක විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර රු. 640,000 ක ලාභයක් වාර්තා කර ඇත. පසුව කරන ලද විමර්ෂණවල දී පහත වැරදි සිදුවී ඇති බව අනාවරණය වී ඇත.

i) සේවකයින්ගෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකය අඩුකර ගෙවූ ශුද්ධ වැටුප වූ රු. 184,000 වැටුප් හා වේතන ගිණුමට පිටපත් කර තිබුණි. සේව්‍ය හා සේවක දෙපාර්ශවයටම අර්ථ සාධක අරමුදල් දායකය වූ පිළිවෙලින් 12% ක් හා 8% ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුමට හා ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමට පිටපත් කර ඇත.

ii) රු. 50,000ක් වූ ආපසු එවුම්, ආපසු එවුම් ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැරකර තිබීම.
වර්ෂ අවසාන ණයගැති ශේෂය මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් සිදුකර ඇත.

iii) 2019.04.01 දින රු. 40,000 කට මිලදී ගෙන තිබූ ලිපිද්‍රව්‍ය රු. 400,000ක් ලෙස කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබුණි. කෙසේ නමුත් මෙය මුදල් ගිණුමට නිසි පරිදි වාර්තා කර ඇත. කාර්යාල උපකරණ පිරිවැය මත 10% බැගින් වාර්ෂිකව ක්ෂය ප්‍රතිපාදනයක් කර ඇත.

iv) ලැබීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු. 30,000, ලැබූ වට්ටම් ලෙස සළකා ගිණුම්ගත කර තිබුණි.

v) 2020 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශනයේ සඳහන් ස්ථාවර නියෝග මත ගෙවා තිබූ රු. 5000 ක පොළී සමග රු. 25000 ක බැංකු ණය වාරිකය ගිණුම්ගත කර නොතිබුණි.

**අවශ්‍ය වන්නේ,**

1) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් **(ලකුණු 20)**

2). ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය **(මුළු ලකුණු 40)**

03. 2020.03.01 දින මුදලින් රු. 500,000 ක් හා රු. 120,000 ක් වටිනා පරිගණකයක්ද යොදා පසිදු වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කළේය. 2020 මාර්තු මාසය තුළ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පහත පරිදි සටහන් කර ඇත.

**සියළුම වටිනාකම් රු.000 වලින්**

| ගනුදෙනු අංකය | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | වෙනත් ලැබිය යුතු දෑ | මුදල් | දිගු කාලීන ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | **+250** | | | **-200** | | **+50** | | |
| 2 | **-80** | **+120** | | | | | | **+40** |
| 3 | **+20** | **-30** | | | | | | **-10** |
| 4 | | | **+1** | **-10** | | | | **-9** |
| 5 | | | | **+200** | **+200** | | | |
| 6 | | **-30** | | **-20** | | **-50** | | |
| 7 | | | | **-10** | | | **+5** | **-15** |
| 8 | **-10** | | **+8** | | | | | **-2** |
| 9 | | **-20** | | **+18** | | | | **-2** |
| 10 | | | | **-12** | **-10** | | | **-2** |

**අතිරේක තොරතුරු**

i) දේපළ පිරියත හා උපකරණ පිරිවැයට 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

ii) 2020 මාර්තු මාසය සඳහා රු. 1000 ක් වූ විදුලි බිල අප්‍රේල් මාසයේ ලැබී ඇත.

**අවශ්‍ය වන්නේ,**

1) ඉහත ගනුදෙනු අංක 1 සිට 10 දක්වා සිදු වී ඇතැයි අපේක්ෂිත ගනුදෙනුව

2). 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

3). 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40)**

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. අ) තුරුලිය සමාගම (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. මෙම ආයතනයේ 2020.03.01 දිනට මුදල් ගිණුමේ රු. 200,000 ක බැර ශේෂයක් විය. 2020.03.31 දිනෙන් අවසන් මාසයේ සිදු වූ ගනුදෙනු උපුටනයක් පහත දැක්වේ.

i) මුදල් ලැබීම් හා ගෙවීම් සමහරක්

| | (රු.000) |
|---|---|
| බැංකු ණය | 200 |
| අත්පිට විකුණුම් (8% VAT ඇතුළුව) | 2160 |
| ලද ගෙවල් කුලී | 50 |
| ණයගැති ලැබීම් (දුන් වට්ටම රු. 75,000 යි) | 1500 |
| අත්පිට ගැනුම් (8% VAT ඇතුළුව) | 1620 |
| මෙහෙයුම් වියදම් | 1300 |
| ගෙවූ ණය වාරික (පොලිය රු. 5000 ක් ඇතුළුව) | 15 |

ii) ණය හිමි ලෙජරයෙන් උපුටා ගැනීම

| ණය හිමියා | 2020.03.01 ට ශේෂය | ගැනුම් | ආපසු යැවුම් | මුදල් ගෙවීම් | ලද වට්ටම් | 2020.03.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| අමල් | 200 | 1200 | 300 | 650 | 15 | 435 |
| බිමල් | 150 | 500 | 150 | 355 | 10 | 135 |
| ඩිමල් | (20) | | | | | (20) |
| **එකතුව** | **330** | **1700** | **450** | **1005** | **25** | **550** |
| ගැනුම් හා ආපසු යැවුම් 8% VAT රහිතව දක්වා ඇත. | | | | | | |

2020.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය ණයහිමි ලෙජර ශේෂ එකතුව සමග එකග නොවිනි. පසුව කරන ලද පරීක්ෂාවේ දී පහත දෑ හෙළිදරව් විය.

1. ණය හිමි ලෙජර ගිණුම්වල 8% VAT නොසළකා ගිණුම් තබා ඇත.
2. ණය හිමියන්ට ගෙවීම්, ණයහිමි පාලන ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 1,050,000 ක් ලෙසිනි.
3. ලද වට්ටම් පොදු ලෙජරයට පිටපත් කර නැත.

**අවශ්‍ය වන්නේ,**

1) ලැබීම් ජ'නලය හා ගෙවීම් ජ'නලය
2) ගැනුම් ජ'නලය හා ආපසු යැවුම් ජ'නලය
3) මුදල් පාලන ගිණුම
4) වැරදි නිවැරදි කිරීමට පෙර ණය හිමි පාලන ගිණුම
5) වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන්
6) සංශෝධිත ණය හිමි පාලන ගිණුම
7) සංශෝධිත ණයහිමි පාලන ගිණුමේ ශේෂය, ණය හිමි ලෙජර ශේෂ එකතුව සමග සසදන ප්‍රකාශනය

**(ලකුණු 30)**

(ආ) ඉහත තුරුළිය සමාගමේ 2020.03.31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය, එදිනට ලද බැංකු ප්‍රකාශනය සමග එකග නොවිණි. පසු පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

i) බැංකුව අයකළ ගාස්තු රු. 5000 යි. ස්ථාවර නියෝග මත ගෙවන ලද රක්ෂණ ගාස්තු රු. 20,000 යි.
